# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2023

2025 අගෝස්තු / සැප්තැම්බර්

සමාජීය විද්‍යා පීඨය

## ආර්ථිකවිද්‍යාව

**මහා බ්‍රිතාන්‍යයේ සහ ශ්‍රී ලංකාවේ ආර්ථික ඉතිහාසය - ECON 18224**

එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්වත් තෝරාගෙන
ප්‍රශ්න **පහකට (05)** පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

**පළමු කොටස - මහා බ්‍රිතාන්‍යයේ ආර්ථික ඉතිහාසය**

01. මධ්‍යතන යුගයේ එංගලන්ත කෘෂිකාර්මික විප්ලවය සඳහා බලපෑ කරුණු සාකච්ඡා කර කෘෂිකාර්මාන්තයේ වර්ධනයට පළමුවන ඉඩම් කොටුකිරීමේ ව්‍යාපාරයෙහි දායකත්වය අගයන්න.

02. "කාර්මික විප්ලවය හුදු ශිල්ප ක්‍රමවල සිදුවූ විපර්යාසයක් පමණක් නොවේ." එංගලන්තයේ අත්දැකීම් ඇසුරින් මෙම ප්‍රකාශය විමසන්න.

03. "ප්‍රවාහන දියුණුව ආර්ථික සංවර්ධනයේ පූර්ව අවශ්‍යතාවකි" මෙම ප්‍රකාශය බ්‍රිතාන්‍ය දුම්රිය ව්‍යාපාරය ඇසුරින් සාකච්ඡා කරන්න.

04. බ්‍රිතාන්‍ය අනුගමනය කළ ජාතික ආර්ථික ප්‍රතිපත්ති අතර වාණිජවාදයට වැදගත් තැනක් හිමිවන්නේ කවර කරුණු නිසා දැයි විමසන්න.

05. පහත දක්වෙන මාතෘකා දෙකක් පිළිබඳව සටහන් ලියන්න.

   අ) එංගලන්තයේ ධාන්‍ය නීති
   ආ) බණ්ඩාරගම් ක්‍රමය
   ඇ) චාර්ටිස්ට් ව්‍යාපාරය

**දෙවන කොටස - ශ්‍රී ලංකාවේ ආර්ථික ඉතිහාසය**

06. ශ්‍රී ලංකාවේ වැඩවසම් ක්‍රමය හඳුන්වා යටත්විජිත පාලනය එය අහෝසි කිරීම මගින් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සිදුවූ බලපෑම පැහැදිලි කරන්න.

07. කෝල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණ මගින් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට වූ සේවාව විමසන්න.

08. යටත්විජිත යුගයේ ශ්‍රී ලංකාවේ වතුවැවිලි කෘෂිකර්මාන්තයේ ආර්ථික දායකත්වය අගයන්න.

09. වැවිලි ආර්ථිකය මගින් ශ්‍රී ලංකාවේ සමාජය තුළ ධනවාදය ක්‍රියාත්මක වූ අයුරු සාකච්ඡා කරන්න.

10. ශ්‍රී ලංකාවේ දේශීය කෘෂිකර්මාන්තය දියුණු කිරීම සඳහා යටත්විජිත රජය මගින් සපයන ලද දායකත්වය විමසීමට ලක්කරන්න.

*********************************